# දුව නයිට්‍රජන් ප්‍රතිකාරය (Cryotherapy)

## (1) ක්‍රයෝතෙරපි (Cryotherapy) ප්‍රතිකාරය යනු කුමක්ද?

මෙය සම මතුපිට ඇතිවන ඉන්නන් (Viral Warts), විවිධ ගැටිති වර්ග (eg:- Seborrhoeic keratosis) සහ ලප කැළැල් ඉවත් කිරීම සඳහා යොදා ගන්නා ප්‍රතිකාර ක්‍රමයකි.

මේ සඳහා සුලභව භාවිතා කරන්නේ දුව නයිට්‍රජන් ය. (Liquid Nitrogen)

## (2) ප්‍රතිකාර ලබා දෙන්නේ කෙසේද?

- දුව නයිට්‍රජන් ($LN_2$) විශේෂ උපකරණයක් (Spray Gun) ආධාරයෙන් ස්ප්‍රේ කිරීම හෝ පුළුන් (Cotton buds) ආධාරයෙන් එම ස්ථානයේ ආලේප ගැල්වීම සිදු කරයි.

- මෙම ප්‍රතිකාරය සඳහා ගතවන්නේ සුළු කාලයක් (තත්පර කිහිපයක්) වන අතර ප්‍රතිකාර ලබන ස්ථානය ක්ෂණිකව සුදු පැහැයට හැරී නැවත මුල් තත්ත්වයට පත්වීම නිරීක්ෂණය කළ හැක.

- ප්‍රතිකාරය කරන මොහොතේ සුළු වේදනාවක් හෝ අපහසුතාවක් ඇතිවිය හැකි නමුත් එය ඉක්මනින් පහව යයි. වේදනාව දිගටම පවතීනම් පැරසිටමෝල් වැනි වේදනා නාශක ඖෂධයක් ලබා ගැනීම යෝග්‍ය වේ.

## (3) ප්‍රතිකාර ලබා ගැනීමෙන් පසු ඔබ දැනගත යුතු දෑ මොනවාද?

- එම ස්ථානය පිරිසිදුව තබාගත යුතුය.

- දින කිහිපයක් ඇතුළත එම ස්ථානය වේලීමකට ලක් වී කබොලක් ලෙස ඉන්නන් හෝ ගැටිති සමෙන් ඉවත් වීම සිදු වේ.

- බොහෝ විට මෙම ප්‍රතිකාරය කිහිප වරක් සිදු කිරීමට සිදුවන අතර එය වෛද්‍යවරයා විසින් නිර්දේශ කරනු ලබයි.

## (4) ප්‍රතිකාරයෙන් ඇතිවිය හැකි අතුරු ආබාධ මොනවාද?

- ප්‍රතිකාර ලබාදුන් ස්ථානයේ දිය බුබුලක් (Blister) ඇති වීම සාමාන්‍ය තත්ත්වයක් වන අතර වේදනාව නොමැති නම් ඒ සඳහා විශේෂ ප්‍රතිකාර අවශ්‍ය නොවේ. එය දින කිහිපයකින් ඉබේම සුව වනු ඇත. එය වේදනාකාරී වේ නම් වෛද්‍ය උපදෙස් පැතීම සුදුසුය.

- ප්‍රතිකාරයෙන් පසුව විෂබීජ ආසාදනය ඉතා අවම නමුත් තුවාල සුව නොවේ නම් හෝ ශ්‍රාවයන් පවතී නම් වෛද්‍යවරයකු කරා යොමු විය යුතුය.

## (5) පසුකාලීනව ඇතිවිය හැකි අතුරු ආබාධ මොනවාද?

- ප්‍රතිකාරය ලබා දුන් ස්ථානයේ සම සුදු පැහැති හෝ අඳුරු පැහැති වීම.
  බොහෝ විට මෙය තාවකාලික වන අතර කාලයත් සමග සම මුල් පැහැයට පත් වේ.

- තුවාල කැළැල් කලාතුරකින් ඇතිවිය හැකි තත්ත්වයකි.

- සම මතුපිට හිරිවැටීම (ඉතා කලාතුරකිනි)
  මාස කිහිපයකින් යථා තත්ත්වයට පත් වේ.